**පාඩම1:**

## ප්‍රති පාක්ෂික ලෝකයක බලාපොරොත්තුව හා ශුද්ධකම

**1පේත්‍රුස් 1:1-2)**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයෙක්වූ පේත්‍රුස් විසින් පොන්තස්හිද ගලාතියෙහිද කප්පදෝකියෙහිද ආසියාවෙහිද බිතිනියෙහිද විසිර ගොස් විදේශීව සිටින්නාවූ, ආත්මයාණන්වහන්සේගේ පිරිසිදුකිරීමෙන් කීකරුවීමටත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ ඉසිනුලැබීමටත්, පියවූ දෙවියන්වහන්සේගේ පෙර දැනගැන්මේ ප්‍රකාරයට තෝරාගනු ලැබූවන්ට ලියා එවන වගනම්: අනුග්‍රහයත් සමාදානයත් නුඹලාට වැඩිවේවා.

**හැඳින්වීම**

වසර කීපයකට පෙර ඇමරිකා එක්සත් ජනපදයෙහි පුළුල් සංචාරයකින් පසු දිවංගත ප්‍රසිද්ධ ජර්මන් දේව සේවකයෙක් හා දේවධර්මධරයෙකු වූ හෙල්මුට් තෙලික්කෙගෙන් ඇමරිකානු කිතුණුවන් අතර දුටු ලොකුම වැරැද්ද කුමක්දැයි අසනු ලැබුවා. ඔහුගේ පිළිතුරවූයේ ඔවුන්ට "යෝග්‍ය නොවන දුක්විඳීමේ දක්මක් ඇති බවය".

ඔහුගේ නිරීක්ෂණය තවමත් සත්‍ය යයි මා සිතනවා. එය එසේ නොවුවානම්, ඇදහිලිවන්තයින්ට මොහොතකටවත්, නිතරම දෙවියන්වහන්සේගේ කැමැත්ත යයි හිතකර හා වටිනා වහසි අදහසක් දෙන්නේ කෙසේද? අප 1987දී මකාවු යනවිට, එහි ප්‍රධාන රට වන චීන ජාතික තරුණ කාන්තාවකගෙන් චීනයේ එම ඉගැන්වීම ගැන අසා තිබෙනවාදයි ඇසුවා. ඇය මද සිනහවක් පා හිස සොලවා " නැහැ, එම ඉගැන්වීම චීනයේ එතරම් දුර ගොස් නැහැ" යයි පිළිතුරු දුන්නා.

නමුත් අපට කරදර නැති ජීවිතයක් දෙන්නේ නිතරම දෙවියන්වහන්සේගේ කැමැත්ත නිසා යයි සිතන අයට

"දුක්විඳීමේ යෝග්‍ය නොවන දැක්ම" ගැටළුවක් නොවන්නේය. පරීක්ෂාවන් තුල යන කිතුණුවන්ට එය ගැටළුවක් වන බව මා සොයාගෙන තිබෙනවා.

සමහරු බෙලහීනවීමේ අසනීපයෙන් පෙලෙනවා. නමුත් දෙවියන්වහන්සේට භාරවනවා වෙනුවට, ඔවුන් තිත්තකම හා "ඇයි මම?" යන චෝදනාව වර්ධනය කළා. සමහරු ටික වෙළාවකට ඉවසිය නොහැකි විවාහ ගැන කියනවා, නමුත් "මට යම් සතුටකට අයිතියක් නැද්ද?" කියා සමාවට කරුණක් සමග එය ඉවත්කර ගන්නවා. වෙනත් අය ජීවිතය දෙස අපසු බලා, ඔවුන් මුහුණදුන් ළමා අවධියේ අපචාර ගැන තරහින් චෝදනා කරනවා, මට උන්වහන්සේ වුවමනා වූවිට දෙවියන්වහන්සේ සිටියේ කොහේද? මා වින්දා මෙන් අහිංසක ළමයෙකුට එසේ වීමට ඉඩදෙන්නේ කුමන වර්ගයේ දෙවිකෙනෙක්ද?

මේ හැම කෙනෙක්ම පොදුවේ බෙදාගන්නේ යෝග්‍ය නොවන දුක්විඳීමේ දැක්මක් ගැනය. දෙවියන්වහන්සේ වෙතට ඔවුන්ගේ ඇති තිත්තකම නිසා, ඔවුන් උන්වහන්සේට යටත්වීම තුල නොසිටියි. ඔවුන් පරීක්ෂාවේ හා පාපයේ අනතුරට ලක්ව සිටිනවා. දුක්විඳින අනෙක් අය දෙවියන්වහන්සේට යටත්ව සිටිනවා විය හැක. නමුත් එය කෘතඥතා විශ්වාසයකට වඩා නොසතුටු මුහුණකින් ඉල්ලා අස්කරගැනීමක් මෙන්ය.

ඔවුන්ගේ ගැටළු නිසා ඔවුන් මානසික අවපාතයකට පත්ව සිටිනවා. සමහරවිට සියදිවි නසාගැනීමට පවා කරුණක් කරගන්නවා. ඔවුන් බලාපොරොත්තු නැතිකරගෙන තිබෙනවා.

මේ සියලු දෙනාට අවශ්‍යවන්නේ ප්‍රතිපක්ෂවූ ලොවක් තුල **බලාපොරොත්තුව** හා **ශුද්ධකම** යන දෙකය. ඔවුන්ට 1පේත්‍රුස් පණිවිඩය අසා භාවිතා කිරීමට අවශ්‍යයයි කියන්නේ එබැවිනි.

ප්‍රේරිතවරයා මෙම ලිපිය ලියුවේ අද උතුරු තුර්කිය පුරා විසිරී සිටින කිතුණුවන්ටය. ඔහු සමහරවිට එය ලියුවේ රෝමයේ සිටය. ක්‍රි.ව 64, එම නගරය නීරෝගේ බිහිසුනු කිතුණු වදහිංසනයට පෙර ( "සංකේතයක් ලෙස" බැබිලොනිය" යයි සඳහන් කර ඇත. (5:13) නමුත් රෝම කුරුසියක් මත මනුෂ්‍ය මාංශය ලෙස මරණයට පත්ව, මරණයෙන් නැවත නැගිටුන යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ ලෙස තබන ලද මෙම නව විශ්වාසය නිසා බොහෝදෙනා මත පීඩාව පැවතුනේය. ඇදහිලිවතුන් අපවාදයට ලක්විය. (2:12, 3:14-16, 4:14). අන්‍යජාතික කිතුණුවන් ඔවුන්ට පෙර, පාපය තුල සිටි අයගේ අපහාසයට ලක්විය. (4:4) මෙම කිතුණුවන්ට තමා පිටට පැමිණි පරීක්ෂාවන් හසුරුවාගන්නේ කෙසේදැයි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමට කරමින් සිටි ඔවුන්ගේ සෙවීම තුල දැනගැනීමට වුවමනාවිය.

පේත්‍රුස් ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ වෙතට යොමු කළේය. මෙය ප්‍රතිපාක්ෂික ලොවක් තුල එල්ලවන අසාධාරණ පීඩාවන් වලට ඔරොත්තු දෙනුලැබූ අපේ ශ්‍රේෂ්ඨ උදාහරණයයි. මොවුන් බලාපොරොත්තුව හා ශුද්ධකම යන දෙකම පියාණන්වහන්සේගේ සර්වබලධාරී අරමුණට උන්වහන්සේ විසින්ම යටත්කරනු ලබමින් හසුරුවනු ලැබීය. 1පේත්‍රුස්හි පණිවිඩය එයයි.

ප්‍රතිපාක්ෂික ලෝකයක වුවද කිතුණුවන්ට බලාපොරොත්තුව හා ශුද්ධකම තුල ජීවත්වීමට හැකිය.

අප සියලුදෙනා එක් ආකරයක හෝ වෙනත් ආකාරයක පරීක්ෂාවන්ට මුහුණ දෙන නිසා අප සියලු දෙනාට මෙම ප්‍රායෝගික පණිවිඩය වුවමනාය. යේසුස්වහන්සේ අනුගමනය කිරීම තුල ඇදහිලිවන්තයා පීඩා වලින් මග හැරවීමේ සටන පේත්‍රුස් කරගෙන ගියා.

ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධ වෙන්නාක් මෙන් පුදුම නොවෙල්ලා.(4:12)

ප්‍රතිපාක්ෂික ලෝකයක් තුල වුවද කිතුණුවන්ට දෙවියන්වහන්සේට යටත් වෙමින් බලාපොරොත්තුව හා ශුද්ධකම තුල ජීවත්වීමට පුළුවන.

අපි හැමදෙනාම එක් ආකාරයක හෝ වෙනත් ආකාරයක පරීක්ෂාවන්ට මුහුණ දෙන නිසා අප සියලුදෙනාටම මෙම ප්‍රායෝගික පණිවිඩය අවශ්‍යය. ඇදහිලිවන්තයා පරීක්ෂාවෙන් මගහැරවීමට යේසුස්වහන්සේ අනුගමනය කිරීම හැර වෙනත් ඉන් ඉතා දුර!, පොරොන්දුවක් පේත්‍රුස් විසින් නොදෙන්නේය. නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධවෙන්නාක් මෙන් පුදුම නොවෙල්ලා. (4:12) යයි ඔහු කියයි. නමුත් ඔහු අප ක්‍රිස්තුස්වහන්සේ වෙතටත් ස්වර්යෙහි ඇති මහිමවත් පොරොන්දු වෙතටත් අප යොමුකරයි. මෙම විශිෂ්ඨ ලිපිය තුල ගොනුවී ඇති පාඩම් අප ඉගෙනගන්නවා නම්, එය මෙම ප්‍රතිපාක්ෂික ලෝකය තුල ජීවත්වීම සඳහා අප ශක්තිමත් හා ධෛර්යමත් කරනවා ඇත.

ආරම්භක සුභ පැතුමකින් පස් පොත කොටස් තුනකට වැටේ.- J. Sidlow Baxter, *Explore the Book* [Zondervan], p. 303):

**හඳුන්වාදීමේ සුභ පැතුම:**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයෙක්වූ පේත්‍රුස් විසින් විසිර ගොස් විදේශීව සිටින්නාවූ, කීකරු වීමටත් තෝරාගනු ලැබූවන්ටත් (1:1-2)

**1. ජීවනයේ බලාපොරොත්තුව: එය වගාකරගන්නේ කෙසේද? (1:3- 2:10).**

ජීවන බලාපොරොත්තුව වගාකර ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේ ජීවමාන ගැළවුම්කරු (1:3-21), ජීවමාන වචනය (1:22-23) හා ජීවමාන ගල බව දැනගැනීමෙන්,

**2. විදේශගත ජීවිතය: එය ගතකරන්නේ කෙසේද? (2:11-3:12)**

විදේශගත ජීවිතය(2:11-12) යටත්වීම තුල ශුද්ධවන්තයින් හැටියට කිතුණු පුරවැසියන් ලෙස (2:13-17)

කිතුණු සේවකයින් ලෙස( 2:18-25), කිතුණු සහායකයින් ලෙස (3:1-7) වැරදී ඇති කිතුණු සාක්ෂි මෙන්(3:8-22) ජීවිත ගතකරන්නෝය.

**3. උග්‍ර පරීක්ෂාව එය දරාගන්නේ කෙසේද?(4:1-5:11)**

කිතු දහම උග්‍ර පරීක්ෂාවන්හි ජීවිතයක් වියහැක, නමුත් ශුද්ධවන්තයන් ලෙස අපට ඒවා ප්‍රයෝජනවත් ලෙස දරාගන්නට පුළුවන.(4:1-6) සේවය කරන අය හැටියට සන්සුන්ව දරාගත හැක.(4:7-11), බලාපොරොත්තු ඇති මිනිසුන් හැටියට ප්‍රීතියෙන් දරාගත හැක. (4:12-19), යටහත් මිනිසුන් හැටියට සහයෝගීව දරාගත හැක. (5:1-11)

**අවසන් කිරීමේ සුභ පැතුම්:** දෙවියන්වහන්සේගේ සැබෑ අනුග්‍රහයයි, එය තුල ස්ථිරවන්න! (5:12-14)

පොතෙහි ප්‍රධාන තේමාවන් බොහොමයක්ම ආරම්භක සුභ පැතුමෙහි සාරයයි. (1:1-2)

## 1. ප්‍රතිපක්ෂ ලෝකයක ජීවත්වන කිතුණුවන්.

පේත්‍රුස් ඔහුගේ පොතෙහි අමතන්නේ පොන්ටුස්, ගලාතිය, කපදෝනිය, ආසියාව බිතිනියාව( නවීන තුර්කියේ උතුරු පළාත ) විදේශින් ලෙස විසිරී සිටින අයටය. මෙම සභාවන් ආරම්භව ඇත්තේ පෙන්තකොස්ත දිනයේ සිට පේත්‍රුස් ගමන් කළ මිෂනාරි පළාත් වලදී කළ කථාවන් කරණකොට ගෙන හරුනු අයගෙන් විය හැක. (ක්‍රියා2:9) ප්‍රේරිතවූ පාවුල්ගේ හැරීමෙන්, අසල පළාත්වල දේශනා කළ අතර ඔහුට ආසියාව හා බිතිනියට යාමට ශුද්ධාත්මයාණන් විසින් වළක්වනු ලැබ තිබුනේය. ( ක්‍රියා 16:6-7) මේවායේ යම් සංයුක්තයක් වුවාද වියහැක.

විසිර සිටි" යනු යුදෙව්වන්ගේ පලස්තීනයෙන් පිට විසිරීමට යොදාගත් ඩයසපෝරා යන ග්‍රීක් වචනයෙහි අර්ථයයි (යොහාන් 7:35), යාකොබ් 1:1) පේත්‍රුස් මෙම කිතුණුවන්ට කීවේ ඩයසපෝරා හෙවත් දෙවියන්වහන්සේගේ විසුරුනු සෙනඟ කියාය. පරණ ගිවිසුමේ බොහෝ සම්බන්ධතා විනිෂ්චය කරමින් මෙම යැවුම් පත්‍රයෙහි මෙම සභාවන් වල බොහෝ යුදෙව් ඇදහිලිවතතුන් සිටි බවක් දැක්වේ, නමුත් බොහෝ සම්බන්ධතා මගින් අන්‍යජාතිකයින් බොහෝ දෙනෙක් සිටි බවද පෙන්වා දේ. (1:14,18) 2: 9-10,18)

(සේවකයින් )4:1-4) "විදේශීන්" (2:11) යන්නෙහි උරුමක්කාර අදහස් දෙකක් ඇත. එනම් අප විදේශිකයින් හා තවකාලික පදිංචිකරුවන් යනුවෙන්ය. විදේශීන් හැටියට අප මේ නපුරු ලෝකයට අයිති නැත. යේසුස්වහන්සේගේ වචන තුල අප ලෝකය තුල නමුත් ලෝකයේ නොව යන අදහස දැක්වේ.( යොහාන්7:13-16) අප එහි භාෂාව කථා කළයුතු නැත, චාරිත්‍ර අනුගමනය කළ යුතු නැත. අපේ හැසිරීම මේ ලෝකයේ පදිංචි අයගෙන් වෙනස්විය යුතුය.

ඇත්තෙන්ම ඔබ විදේශිකයෙකු ලෙස ගත කරමින් සිටීමට කිසිවිටෙක විදෙස් රටකට ගොස් තිබෙනවාද?

1987දී අප චීනයට ගියවිට එක් සැන්දෑවක ගුඅන්ෂුවා වීදියෙහි ඇවිදිමින් සිටියා එහි අප වෙන කිසිම බටහිර ජාතිකයෙක් දුටුවේ නැහැ. මිනිසු අප දෙස නෙත් හෙලා බැලුවා අපද එසේ කළා ඔවුන්ගේ චාරිත්‍ර සිත්කළු බව අප දැනගත්තා. නමුත් අපේ ඒවාට වඩා බොහොම වෙනස්. ප්ලාස්ටික් දවටන වල ඔතා ඇති මළ කුකුළන් හා මාළු මිලදී ගන්නවා වෙනුවට චීන ජාතිකයින් මිලදී ගතතේ පන ඇති කුකුළන්, තාරාවන් හා මාළු ආදියයි. කුරුල්ලන් නාද දෙති මාළුවන් වෙළඳ පලෙන් ගෙනාවාමෙන් අවසන් හුස්ම හෙළීමට පන අදිති. ඔවන්ගේ චාරිත්‍රයට අනුව ඒවා වඩා පෝෂ්‍යදායක බවට සැක නැත. විදේශියෙක්ව සිටිනිසා මා පසුතැවිලි විය යුතුය. මක්නිසාද මගේ රාත්‍රී කෑම ගෙදර ගෙනාවිට එය තවමත් පන පිටින් වුවානම් මා කුමක් කරයිදැයි නොදනියි!

පේත්‍රුස්ගේ ප්‍රියතම වචවන වලින් එකක් ඇනස්ට්‍රොෆි නම් ග්‍රීක් වචනයයි . ඔහු එය 1පේත්‍රුස්හි සය වරක් පාවිච්චි කරයි. (1:15,18, 2:12,3:1,2 16 2 පේත්‍රුස්හි දෙවරකි (2:7, 3:11 මුළු අළුත් ගිවිසුමේම ඇත්තේ වෙනත් තැන් පහකය. ඉන් කියවෙන්නේ "ජීවත්වෙන විධිය" නැතහොත් "හැසිරීම"ය. කාරණය නම් කිතුණුවන් හැටියට අපේ ජීවත්වන විධිය, අපේ චර්යාව හා හැසිරීම චීනයේ විදේශියෙක් සිටි ආකාරයෙන් විය යුතුය. අප වෙනස් අය මෙන් සිටීමට යුතුයකිංග් ජේම්ස් පරිවර්ථනයෙහි 2:9හි "අමුතු මිනිස්සු" ලෙස සඳහන් වේ. ( ඔබ සමහරවිට "මට අමුතු කිතුණුවන් හමුවෙලා තිබෙනවා යයි සිතනවා විය හැක! එය අද්භූත යන තේරුමක් නොව, වෙනස් යන තේරුමක්ය. දූෂිත අදේව වාදී ලොවක් තුල කිතුණුවන් දේවවාදී මිනිසුන් ලෙස සිටිය යුතුය.

යේසුස්වහන්සේ කළාක් මෙන් පේත්‍රුස් එය පැහැදිලිව සිදු කළේය. එනම් අප තවුසන් මෙන් වීමටවත් ලෝකයෙන් හුදෙකලා වීමටවත් නොව, එය තුල ප්‍රසංසනීය ලෙස ජීවත්වීමටය. (2:12,15,20-21,3:13-17).4:19, 5:9). අප සභාවෙන් වෙන්ව පුද්ගලයින් ලෙස ජීවත්වීමට නොව නමුත් අනික් කිතුණුවන් සමඟ දෙවියන්වහන්සේගේ මිනිසුන් ලෙස සාමුහිකව ජීවත් වීමට යුතුය.(1:22, 2:4-10, 3:8-9, 4:8-11, 17, 5:1-5,9,13:14,).

සමහරු සිතන විධියට "අප ලෝකය තුල ජීවත් වීමට නොව, සභාවට ගොස් සභාවෙහි ජීවත්ව සිට, ලෝකයට යායුතුය". එබැවින් "අමුතුය" යන වචනයෙන් කියවෙන්නේ මේ නපුරු ලෝකයේ අපි විදේශීන් බවය. "අමුත්තන්" යන්නෙහි දෙවන තේරුම නම් අප තාවකාලික පදිංචිකරුවන් යන්නය. අප පදිංචිවීමට සිටිනවා නොව, ස්වර්ගයෙහි අපේ සැබෑ නිවහන බලාසිටින වන්දනා කරුවන්ය. පේත්‍රුස් බොහෝ වාර ගණනක් මෙය සිහිගන්වයි.(1:6), " ටික කලකට"(1:17) "ඔබ පොලොව මත සිටින කාලය තුල"(2:11-12) දැන් ඔබ අමුත්තන්ය නමුත් ගමන යන දිනය පැමිණෙන්නේය(4:2) " මාංශය තුල ගත කරන කාලය" විනිෂ්චය වෙත යන්නේය(4:5) සහ 5:10 " ස්වල්ප කලක් දුක් විඳි පසු".

බලාපොරොත්තුව, ස්වර්ගය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම යන අදහස් හා අනාගත මහිමය යන සියල්ල 1පේත්‍රුස්හි ප්‍රමුඛව ඇත. 1:3-5, 7,13, 17,5:1,4,6 ("සුදුසුවේලාව"), 10. නොඇදහිලිවතුන් දෙවියන්වහන්සේ විසින් විනිෂ්චය කරන බව පේත්‍රුස් යලි යලි පෙන්වා දෙයි. (1:17, 2:7-8, 12, 23, 3:12,18-20), 4:5, 17-18).

මේ සියල්ල දුක් විඳින අයට, විශේෂයෙන්ම ඔබ වටා සිටින ඉතා හොඳින් සිටින බව පෙනෙන්නට ඇති රැවටිලිකාර මිනිසුන් දෙස බලන විට " ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමට වටින්නේදැයි සිතෙන අයට වඩාත් ප්‍රායෝගිකය. සමහරවිට "ඔබ මැරෙනවිට අහසේ සිටින කුරුල්ලෙක්" වැනි ආගමක් යයි මිනිසුන් කිතුදහමට සමච්චල් කරනවා. පැහැදිලිවම එය එසේය!

ක්‍රිස්තුස්වහන්සේ තුල අපට බලාපොරොත්තුව තිබෙන්නේ මේ ජීවිතය ගැන පමණක් නම් අපි සියලුම මනුෂ්‍යයන්ට වඩා අනුකම්පා ලැබිය යුත්තෝයයි පාවුල් කියයි. (1කොරින්ති15:19)

නවීන වෛද්‍ය විද්‍යාවට මා ස්තුතිවන්ත වෙනවා, නමුත් එය තුල අපට මහත් අනර්ථකාරී දෙයක් කර තිබෙනවා. වසර ගණනකට පෙර, මිනිසුන්ට ජීවිතයේ කෙටි බව හා සදාකාලිකයේ යථාර්ථය තුල පහසු ගැනීමට වුමනාවක් තිබුනේ නැත. පවුල් බොහොමයක දරුවන් කීපදෙනෙක්ම මරණින් අහිමිවුනා. බොහෝ වැඩිහිටියන් මේ කාලයේ සුව කිරීමට හැකි දේවල් වලින් මියගියා.

මරණය, මෙම ජීවිතය යනු ඇති සියල්ල නොවේ යන කරුණ නිරතුරුවම සිහිගන්වන්නක් වී තිබුනා. සදාතනිකය ඉදිරියෙහි ඇත, දැන් අප රැවටිලි සමෘධියක දුක්වින්දත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොරොන්දුවූ, ඒ සියල්ල හරිගස්සන දිනයක් පැමිණෙනවා.

නමුත් අප බොහෝවිට, බෙහෙත්වලට කෙනෙකුගේ ජීවිතය වසර කීපයකට දිගු කර ගතහැකි යයි වැරදි ලෙස උපකල්පනය කර, සදාකාලිකයේ යථාර්ථයෙන් මග හරිනවා! නැහැ, පේත්‍රුස් කියයි.

අප අමුත්තන් එනම්ඃ විදේශීන් මෙම පොලොවේ තාවකාලික පදිංචිකරුවන්. දැන් අප ජීවත්වන්නේ ප්‍රතිපාක්ෂික ලෝකයකය. නමුත් අප බලාසිටින්නේ අපේ ගැළවුම්කරුවාණන් අප වෙනුවෙන් ස්වර්ගයෙහි සිට නැවත පැමිණෙන තෙක්ය! එමනිසා

**2. කිතුණුවන්ට මෙම ප්‍රතිපාක්ෂික ලෝකය තුල බලාපොරොත්තුව සමඟ ජීවත්වීමට පුළුවන.**

පරීක්ෂාවන් තුලින් යන මිනිසුන්ට බලාපොරොත්තුව අවශ්‍යය. දෙවියන්වහන්සේ "අපට ජීවනයේ බලාපොරොත්තුවකට නැවත ඉපදීමේ හේතුවක් ඇතිකර තිබෙන බව කියමින් පේත්‍රුස් පටන් ගනියි (1:3) අපේ බලාපොරොත්තුව සම්පුර්ණයෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් වීමේදී අපට ගෙනඑන අනුග්‍රහය මත සවිකර ගැනීමට ඔහු අපට උපදෙස් දෙයි.(1:13) යේසුස්වහන්සේ මරණින් නැගිටි බැවින්, අපේ ඇදහිල්ල හා බලාපොරොත්තුව දෙවියන්වහන්සේ තුලය. (1:21) , 3:5, 15)ද බලන්න.

බයිබලීය බලාපොරොත්තුව ලෝකයේ බලාපොරොත්තුව මෙන් නොවේය. ලෝකයේ බලාපොරොත්තුව තුල හොඳම දේත්, අවිනිෂ්චිතය. " මගේ ආයෝජනය ලාභ ලබනවා ඇතැයි" අප කියනවා, ඒ ආකාරයේ බලාපොරොත්තුවක බොහෝ අවුල් සහගතය, වැඩි නිෂිචිත බවක් නැත! නමුත් තවමත් වටහාගෙන නැතත් බොරු කියන්න බැරි දෙවියන්වහන්සේ ඒ පිටුපස සිටින නිසා එය නිෂ්චිතය. බයිබලීය බලාපොරොත්තුව නිෂ්චිතය.

එය මේ වගේයඃ ඔබටත් මටත් ලෝක කුසලානය ක්‍රිකට් තරගාවලිය බැලීමට අතපසු වුයේ නම්, දිනු කණ්ඩායම මා අසා තිබුනා, ඔබ අසා තිබුනේ නැහැ. අප අවසන් කරග වීඩියෝ පටියකින් බැලීමට වාඩිවුනා,

මම ඔබට කියනවා "තරගය ගැන මිත්‍රශීලී ඔට්ටුවක් අල්ලන්න ඔබ කැමතිද?" කියා, එම ඔට්ටුව ඇල්ලීමට ඔබ මෝඩ වෙනවා, ඇයි? ක්‍රීඩාව කෙසේ සිදුවෙමින් තිබුනාද කියා මා හරියටම නොදැන සිටියත් අවසන් ප්‍රතිඵලය කුමක්ද කියා මට නිෂ්චිත නිසාය. කිතුණුවන්, ජීවිතයේ සිදුවීම් දිගහැරෙන්නේ කෙසේදැයි හරියටම නොදන්නවා වියහැකි නමුත් කාගේ පැත්ත දිනනවාද කියා නිෂ්චිතව අප දන්නෙමුව. අපට ස්වර්යෙහි තබා තිබෙන මහිමය ගැන අපට නිසැක වීමට පුළුවන. බයිබලීය බලාපොරොත්තුව එයයි!

ආරම්භක සුභපැතුම් වල පේත්‍රුස් මෙම ප්‍රතිපාක්ෂික ලෝකය තුල බලාපොරොත්තු සමඟ ජීවත්වීමට හේතු තුනක් දෙයිඃ

**අ. අප දෙවියන්සේ විසින් තෝරාගෙන තිබෙන නිසා අපට බලාපොරොත්තුවක් තබාගැනීමට පුළුවන**

ග්‍රීක් බයිබල් පදවල "තෝරාගත්" යන වචනය පේත්‍රුස්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයෙක්" යන වචන වලට පසුව පැමිණේ. එය ආරම්භයෙහි අවධානය සඳහා තබා ඇත. පටන්ගැන්මේදීම, දෙවියන්වහන්සේ සමඟ අපේ සම්බන්ධතාවය උන්වහන්සේ මතවු අපේ දුර්වලකම් මත රඳාපවතිනවාට වඩා දෙවියන්වහන්සේගේ නිසැක අල්ලා ගැනීම මත රඳාපවතින බව අප දැනගැනීම පේත්‍රුස්ට අවශ්‍ය වෙයි. අපේ ගැළවීම අප විසින් කරගැනීමක් නොව, එය දෙවියන්වහන්සේගේ කිරීමකි!

මෙලෙස පරීක්ෂා කාල වලදී අපට දෙවියන්වහන්සේට යටත් වීමට පුළුවන. උන්වහන්සේ සර්වබලධාරී නිසා ගැළවීම හා රැකගැනීම උන්වහන්සේගේමය. දෙවියන්වහන්සේගේ සර්වබලධාරීත්වය වන මෙම සැනසිල්ලේ තේමාව මුළු පොත පුරා දිවෙයි. (1:3-5,11-12,20, 2:7-10, 3:17, 22, 4:11, 19:5,,10-11).

දෙවියන්වහන්සේ ගැළවීම සඳහා අප තෙර්රාගැනීමේ මෙම මහත්වූ සැනසිල්ලේ සත්‍යතාවයයි, "ඔව්, නමුත් දෙවියන්වහන්සෙ අප තෝරාගෙන ඇත්තේ උන්වහන්සේගේ පෙර දැනගැන්මේ හැටියට" බව එය කියන බව එම සත්‍යතාවය යටින් බිඳින අය පෙන්වා දෙන්නේ එම තෝරාගැනීම දෙවියන්වහන්සේ ඉතිහාසය තුලට එබිකම්කර, උන්වහන්සේගේ ලැයිස්තුවට දමාගෙන ඇතැයි සිතමින් වියහැක. නුමුත් මොහොතක් සිතා බැලුවොත් එම දැක්ම කෙතරම් යෝග්‍ය නොවනවාදැයි සිතාගැනීමට පුළුවන. එය සදාකාලය සාදයි, දෙවියන්වහන්සේගේ පරම සැලසුම මනුෂ්‍යයාගේ කැමැත්ත මත රඳාපවතියි. එය දෙවියන්වහන්සේ සියල්ල දන්නා ස්වර්ගික දුබලයෙක් වීමක් තුලට දමයි. එබැවින් ඔහු අනාගතය දෙස බලා මෙසේ කීවා " අහෝ, ඔහු කදිම ප්‍රේරිතවරයෙක් හදන නිසා තර්සස්හි සාවුල් මාතුල අදහාගන්නවා ඇත, අපොයි, හොඳයි! උන්වහන්සේ මා ගැන තීරණයක් ගන්නට යනවා! "මම ඔහු තෝරාගන්නා ලැයිස්තුවට දමාගන්නවා", නමුත් මවුකුස පටන් මා වෙන් කළාවූද (ගලාති1:15) යනුවෙන් පාවුල් මෙය පැහැදිලි කරයි.

තවද එවැනි දැක්මක් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නොහැකියාවන් නොසලකන දේකට වඩා හැකියාවන් සලකන දෙයක් බවට හරවයි. තෝරාගැනීම යනු ඇදහීමට සිටින අය දෙවියන්වහන්සේගේ නිකම්ම "කල්තියා දැනසිටීමක්" නම්, එය නිසා මිස ඔවුන් විසින් උන්වහන්සේ තෝරාගැනීමකට වෙනස්වන්නාවූ උන්වහන්සේගේ සර්වබලධාරී තෝරාගැනීමක් කර නැත. නමුත් ශුද්ධ ලියවිලි පැහැදිලි කරන්නේ උන්වහන්සේ කැමති අය දෙවියන්වහන්සේ තෝරාගන්නා බවයි. සරලව උන්වහන්සේගේ තෝරාගැනීම නිසා(රෝම9:11,16,18).

"පෙරදැනගැන්මේ" යන වචනයෙන් කියවෙන්නේ ලෝකයේ අත්තිවාරමට පෙර උන්වහන්සේගේ මනුෂ්‍යයින් තෝරාගැනීම ගැන විශේෂ හැඟීමකින් දැනසිටීමය. දෛවය යන අදහස අඟවන්නේ " පෙරදැනගරන්මයි"(1පේත්‍රුස් 1:20, ක්‍රියා 2:23, රෝම8:29)

### ආ. ත්‍රිඑක දෙවියන්වහන්සේ අප ගළවාගෙන ඇති නිසා අපට බලාපොරොත්තුවක් ඇතිව සිටීමට පුළුවන්.

පේත්‍රුස් තම පාඨකයින් ත්‍රිත්වය පිළිගන්නා බව උපකල්පනය කළා. ඔහු එය තේරුම්කරදීමට හෝ ආරක්ෂා කිරීමට නැවතුනේ නැත. ඔහු සඳහන්කරන්නේ පියවූ දෙවියන්වහන්සේගේ පෙරදැනගැන්ම ලෙස ආත්මයාණන්වහන්සේගේ පවිත්‍ර කිරීමෙන් අපට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිගත හැකිවන පරිදි තෝරාගෙන ඇති බවය. දෙවියන්වහන්සේ -"සම සදාතනික" පුද්ගලයින් තිදෙනෙකුගේ පැවැත්මකි. එය එකම භාවර්ථයකින් නමුත් වෙනස් උපවර්ථන වලින් යුක්තය. ඒ සෑම පුද්ගලයෙකුගේම දේවත්ව තුල අපේ ගැළවීම සම්බන්ධව භූමිකාවක් ඇත. අපේ ගැළවීම මෙම උතුම් ත්‍රිත්වයේ දෙවියන්වහන්සේ මත රඳා පවතින නිසා අපට බලාපොත්තුව තබා ගැනීමට හැකිය.

**ඇ. අප දෙවියන්වහන්සේගේ අනුග්‍රහය හා සමාදානයේ බහුලත්වය අත්විඳින නිසා අපට බලාපොත්තුව තබාගැනීමට හැකිය.**

" අනුග්‍රහය හා සමාදානය" කිතුණු සුභපැතුමේ ආකාරයයි. නමුත් එය ඊට වැඩි දෙයක්ය. දෙවියන්වහන්සේගේ අනුග්‍රහය සෑම කිතුණුවෙකුගේම සිදුවිය යුතු පරිද්දෙන් පේත්‍රුස්ගේ ජීවිතයේද පෙලඹවීමේ සාධකය වූයේය.

ඔහු එම වචනය සෑම පරිච්ඡේදයකම යොදා ඇත, ඒ සියල්ල දසවරක්ය.(1:2,10,13,2:19-20, 3:7,4:10, 5,5, 10,12).

"පේත්‍රුස්" යැවුම් පත්‍රයේ පළමු වචනය දෙවියන්වහන්සේගේ අනුග්‍රහය වඩාත් පෞද්ගලික ආකාරයකට විදහාපායි. අවස්ථා කීපයකදීම අස්ථාවර සීමොන් කාලකණ්නි ලෙස අසමත් වුනා. නමුත් වඩා දරුණු ලෙස ඔහු ස්වාමීන්වහන්සේ ප්‍රතික්ෂේප කරන විට ඔහු දෙවියන්වහන්සේ බොහෝ සේ පාවිච්චි කළ පේත්‍රුස් (පර්වතය) බවට පත්වුනා. දෙවියන්වහන්සේගේ අනුග්‍රහය අත්දැකීමේ ඇතුලාන්ත ඵලය "සමාදානයයි.

"පේත්‍රුස් ප්‍රේරිතයෙක්" යන වචනවල අප විසින් පවත්වාගත යුතු සියුම් සමබරතාවයක් අඩංගුය. " පේත්‍රුස්" විදහාපාන්නේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහයයි, එය උන්වහන්සේ අපේ පාප වලට සමාව දී අපට යෝග්‍ය නොවන ආශිර්වාද වස්සවන්නේය.

"ප්‍රේරිත" යනු අධිකාරිත්වය යටතේ එවුකෙනාය. එය පේත්‍රුස් අපට ලියන දේවල් උපකාරක යෝජනා නොවන නමුත් දිව්‍යමය නියෝග බව පෙන්වයි. "අනුග්‍රහය" හා දෙවියන්වහන්සේගේ නියෝග වලට

"කීකරුරවීම" අතර ප්‍රතිවිරෝධයක් නැත.

ප්‍රතිපක්ෂ ලෝකයක කිතුණුවන් විදේශින් මෙන් ජීවත්වෙනවා අප දැක තිබෙනවා නමුත් ඔවුන්ට බලාපොටෙරාත්තුව සමඟ ජීවත් වෙන්න පුළුවන්. අවසාන වශයෙන්:

**3. කිතුණුවන්ට ප්‍රතිපක්ෂ ලෝකයක ශුද්ධකමෙන් ජීවත්වෙන්න පුළුවන්**

ශුද්ධකම හා කීකකරුකම 1පේත්‍රුස් පොතෙහි ඇති ප්‍රධාන තේමාවන්ය. (1:2, 14-17, 22, 2:1,11,24, 3:2,6,8-9,4:1-11, 15-17.

හැඳින්වීමෙහි මෙම තේමාවන් පිටතට ගෙන ඇත්තේ අපගේ ගැළවීම තුල පිළිවෙළින් ආත්මයාණන්වහන්සේගේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ක්‍රියා හැටියටය.

පළමුව, ආත්මයාණන්වහන්සේගේ පවිත්‍ර කිරීමේ ක්‍රියාව මගින්" අප තෝරගත් අය බව පේත්‍රුස් කියයි. එම යෙදුමම තෝරාගැනීම සම්බන්ධව (2තෙසලෝනික2:13)හි ඇත. " පවිත්‍රකිරීම" යන වචනයෙහි තේරුම " වෙන්කරගැනීමක්" මෙය දෙවියන්වහන්සේ විශ්වාස කරන කෙනෙක් ලෝකයෙන් ඉවත් කරගෙන දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟ තුලට වෙන්කර ගැනීමක්ය. (Ramsey Michaels, *Word Biblical Commentary*, p. 11).

නමුත් වචනයේ ක්‍රියාත්මක වන හැඟීමක්ද තිබෙනවා. එනම් අපේ යටත්වීම සමඟ සහයෝගීව ආත්මයාණන්වහන්සේ ප්‍රගතිශීලි වෙන්කරගැනීමේ ක්‍රියාවලියක් පෙන්වා දෙනවා. process (Simon Kistemaker, *New Testament Commentary: Peter and Jude* [Baker], pp. 36-37, 38). මෙලෙස ශුද්ධකම යන්න ස්ථානික සහ ප්‍රගතිශීලී යෙක් වෙනවා. එය ආත්මයාණන්වහන්සේගේ මහෝතම ක්‍රියාවත් අපගේ කැමතිවීමත් සහයෝගීව මැදිහත්වී සිදුවන දෙයකි.

ඊළඟට පේතෘස් "අප කීකරුකමට තෝරාගත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ ඉසිනු ලැබ " ඇති අය බව කියයි. ව්‍යාකරණානුකූලව "කීකරු" යන වචනය අප මුලින් ශුභාරංචිය පිළිගැනීම හා සම්බන්ධය. පේතෘස් හා පෝල් යන දෙදෙනාම " ඇදහිල්ලේ කීකරුකම" යයි කියන්නේ එයටය. (රෝම1:5, 16:26, 1පේතෘස් 4:17)

ගැළවීමේ ඇදහිල්ල යනු ඇදහිල්ලේ කීකකරුකම බව බයිබලය පැහැදිලි කරයි. ඇත්ත වශයෙන්ම "කීකරුකම" බොහෝ විට යොදාගන්නේ ගැළවීමේ ඇදහිල්ල විස්තර කිරීමටය.( යොහාන්3:36, ක්‍රියා6:7, රෝම10:16,15:18,2තෙසලෝනික1:8, 1පේතෘස්2:8,3:1)

අප ඇදහිල්ලෙන් ගැළවීම ලබා තිබේ. නමුත් ගැළවීමේ ඇදහිල්ල යනු නිකම්ම එකඟවීමක් නොවේ. ඊට වඩා එය නිතර දෙවියන්වහන්සේට කීකරු වෙමින් ඉදිරියට යන ක්‍රියාකාරී විශ්වාස කිරීමක්ය.

"යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ ඉසිනු ලැබ" යන යෙදුම මෝසෙස්ගෙන් පැමිණෙන්නකි. මෝසෙස්ගේ ගිවිසුම ආරම්භ කිරීමේදී ඉශ්‍රායෙල්වරුන්ට ලේ ඉසිනු ලැබුවේය. (නික්මයාම24:3-8).

හෙබ්‍රෙව් පොතෙහි මෙය යේසුස්වහන්සේට භාවිතා කරයි. " නීකරුවීම" අපේ කොටස දෙස බලයි, ලේ ඉසීම ක්‍රිස්තුස්වහන්සේගේ කොටස දෙස බලයි.

නව ගිවිසුම ආරම්භ කිරීමට බොහෝ දෙනෙකුගේ පව් උසුලන පිණිස උන්වහන්සේම එක වරක් පුජාවු සේක. ( හෙබ්‍රෙව්9:19-28).

මෙසේ පේතෘස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ අපේ හදවත්වල තැවරීමෙන් ආරම්භක පවිත්‍ර කිරීමක් සිදුකරයි. අප විසින්ම උන්වහන්සේ අනුගමනය කිරීමට ඇදහිල්ලෙන් කැපවන විට මෙය සිදුවන්නේය.

"පවිත්‍රකිරීම" යන වචනය සමඟ "ලේ ඉසීම" යන්න ක්‍රියා නාම පදයකි. එයද ඉදිරියට කරගෙන යන ක්‍රියාවලියක අදහස ඇතුලත්ය.

ගැළවීමේ මොහොතේදී ක්‍රිස්තුස්වහන්සේගේ ලේ අපේ සියලු පාප පවිත්‍ර කළත්, අපේ පාප ගැන පසුතැවිලිවීමේදී, අපේ හදවත්වල යලි යලි පවිත්‍ර කිරීමක් සිදුවන්නේය.(1යොහාන් 1:7,9)

මෙලෙස මෙහිදී එම අදහස කිතුණු ජීවිතය පාපවලින් වෙන්ව දෙවියන්වහන්සේට වෙන්වන ආරම්භක හා දිගටම සිදුවන ක්‍රියාවලිය යන දෙකම පැහැදිලිය.

පළමු හා මුලින්ම සිදුවන්නේ දෙවියන්වහන්සේගේ ආත්මය සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන්ය. අපේ ක්‍රියාකාරී කීකරුකමද මැදිහත්වන්නේය.

**අවසානය**

ප්‍රතිපක්ෂ ලෝකයක් තුල බලාපොරොත්තුව සහ ශුද්ධකම යන දෙකටම සම්බන්ධ 1පේත්‍රුස් හි ඇති තවත් ප්‍රධාන වචනයක් නම් "යටත්වීමය"( 2:13, 18,3:1,5,,22 කිස්තුස්වහනසේට දිව්‍යමය යටත්වීමක් (5:5) එය වේදනාවෙන් මගහැරීමට, හා කොහොම හරි ඉටුකරනවා වැනි අපේ දවස්වල ජනප්‍රිය වචන වන" හරි" ගර්විත" වචන මෙන් නොවේය. නමුත් එය දුක්විඳීමේ නිසි දැක්මක් ඇතුව කරන ප්‍රවිෂ්ඨයක්ය. පරීක්ෂාවලට මුහුණ දීමේදී අපට තේරීමක් ඇතිවිට අපම බලකිරීමක් කරමින් දේවල් කෙතරම් අසාධාරණ දැයි චෝදනා කරමින් ඉක්මන් හා පහසු මගක් සොයන්ට පුළුවන. එසේ නැත්නම් උන්වහන්සේගැළවීම සඳහා අප තෝරාගෙන, උන්වහන්සේගේ මහත් බලයෙන් අප ගළවා ඇතිබව දැන ගෙන, දෙවියන්වහන්සේගේ මහෝත්තම අත් වලට භාරවෙන්නට පුළුවන.

අපට බිත්තරයක් මෙන් හෝ අලයක් මෙන් පරීක්ෂා වලට මුහුණ දෙන්ට පුළුවන්! බිත්තරය උතුරන වතුරට මෘදු ලෙස ගොස් තදව පිටට පැමිණෙයි. නමුත් අලය තදව ඇතුලට ගොස් මෘදුව පිටතට පැමිණෙයි. මම ඔබෙන්ම අසන්න කැමතියි, දෙවියන්වහනසේ මගේ ජීවිතයට පරම ලෙසින් එනම් පරම බලධාරියා ලෙසින් ඉඩහැර ඇති පරීක්ෂා වලට මා ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? මම දෙවියන්වහනසේට හරවෙනවාද උන්වහන්සේට විරුද්ධවනවාද? අප ක්‍රිස්තුස්වහන්සේට භාර වනවානම්, අප මේ ප්‍රතිපක්ෂ ලෝකය තුල ජීවත්වන විටඋන්වහන්සේ අපේ හදවත් මෘදු කර අපට බලාපොරොත්තුව හා ශුද්ධකම යන දෙකම දෙන සේක.

**සාකච්ඡාව හා ප්‍රශ්න**

1 දුක්විඳීමේ නුසුදුසු දැක්මක් ඇතිව සිටින කිතුණුවන්ගේ ඔබ දැක ඇති උදාහරණ මොනවාද?

2. ප්‍රායෝගික යෙදුම් වලින් "ලෝකයෙන් වෙන්වීම" යයි කියන්නේ කුමක්ද?

3. තෝරාගැනීමේ දර්ශනය ඔබ පහසු කරනවාද? අවුල් කරනවාද? ඇයි?

4. පරීක්ෂාවලදී දෙවියන්වහන්සේට භාරවීම යනු අකර්මන්‍ය දේවවාදයද?

එයින් කියන්නේ කුමක්ද?